**කැලණිය විශ්වවිද්‍යාලය - 2019**
**------------------------------------**

## 1.1 මතය ව්‍යාචනය
**------------------**

කැලණිය විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම
**--------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි ඡේද 49 අනුව දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත් වන දේපල පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, අගය රු.127,033,367 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එසේම මෙම ප්‍රත්‍යාගණනය නොකළ ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ද ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ දී ඉඩම් හා ගොඩනැගිලි ඉවත් කිරීමක් සිදු කර නොතිබිය දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ | ගිණුම්කරණ ප්‍රමිත යළි අධ්‍යයනය කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් දී | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්කරණ ප්‍රමිත 07 හි 55 ඡේදය අනුව ප්‍රත්‍යාගණන අතිරික්ත ගිණුමෙන් රු.135,602,989 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට නිවැරදි නොවන ආකාරයට ගලපා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ප්‍රත්‍යාගණන සංචිතය පිළිවෙලින් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා අඩුවෙන් දැක්වුණි. | ඇත. | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 අනුව අස්පීත්වයක ස්ථාවර වත්කම් එම වත්කම් වල ස්වභාවය හා මෙහෙයුම් කටයුතු සඳහා යොදාගනු ලබන ආකාරය අනුව වර්ගීකරණය කර එක් එක් වත්කම් පන්තියේ ඵලදායී ජීවිත කාලය අනුව ක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. එසේ වුවත් විශ්වවිද්‍යාලයේ ලී බඩු හා උපකරණ හා විද්‍යුත් උපාංග ඒවායේ ස්වභාවය හා ඵලදායී ජීවිත කාලය පිළිබඳ නොසලකා ලී බඩු හා උපකරණ ලෙස එකම වත්කම් පන්තිය යටතේ වර්ගීකරණය කර තිබුණි. එසේම විද්‍යුත් උපාංග ක්ෂය කිරීමේ ප්‍රතිශතය වර්ෂයකට සියයට 20 බැගින් සිදු කරනු ලබන බව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය නොකර පිරිවැය රු. මිලියන 1,477 ක් වූ එම වත්කම් සියයට 20 බැගින් ක්ෂය කර තිබුණි. | 2020 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබයි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බාහිර ආයතනයකට ලබා දී තිබුණ තක්සේරු කළ ඉඩම්වල වටිනාකම රු.159,970,745 ක් වූ අගය ගිණුම්වලින් ඉවත් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු සමස්ත ඉඩම්වල වටිනාකම ඉහත අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉඩම්වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) 2018 වර්ෂයේ දී වාහන වලට අදාල රු. 22,988,000 ක ක්‍රමක්ෂය ප්‍රත්‍යාගණන ගිණුමෙන් දෝෂ සහගත ලෙස අඩු කිරීම | 2020 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රමක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඈ)කැලණිය විශ්වවිද්‍යාල භූමියේ පිහිටා ඇති මහජන බැංකු ගොඩනැගිල්ල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂයේදී ලැබී තිබූ රු.2,900,000 ක බදු ආදායම ඉකුත් වර්ෂයේ ආදායමක් ලෙස ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදී අවම කිරීමට උපදෙස් දී ඇත. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ)බැංකු ජංගම ගිණුමක 2016 හා 2017 වර්ෂවල සිට පැවත එන හඳුනා නොගත් ඍජු බැර කිරීම් වටිනාකම රු.525,000 ක් හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. එසේම ජංගම ගිණුම් දෙකකට අදාලව 2019 වර්ෂය තුළ හඳුනා නොගත් රු.4,356,795 ක්වූ ඍජු බැරකිරීම් 60 ක් හඳුනා ගැනීමකින් තොරව විවිධ ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | ඍජු බැරකිරීම් හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන හා උපයන ලද ආදායම් | මිලියන 5,642 | ජ'නල් වවුචර් 419 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරිපත් වී නොමැත. | මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීමේදී 2018 දෙසැම්බර් 18 දිනැති අංක AGGen/Sec/2018/82 දරන ජාතික විගණන කාර්යාලයේ චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණකරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අදාළ අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ ආචාර්යවරු වෙනුවෙන් ගෙවන ලද රු. 694,603 ක (ඇමරිකන් ඩොලර් 3840) අනියම් දීමනා විගණිත දිනය වූ 2020 ජුනි 22 දින දක්වාම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ අංශ දැනුවත් කර මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | විධිමත් අනුමැතිය මත වියදම් කිරීම කළ යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ දක්වා තිබුණු සේවක ණය ශේෂය තුළ වසර එකේ සිට වසර හතර කට වඩා වැඩි ණය ශේෂය රු. 82,561,766 ක් වූ අතර වසර පහකට වැඩි ණය ශේෂ රු. 652,784 ක් විය. අඩමාණ ණය ලෙස රු.43,652 ක් පමණක් වෙන් කර තිබුණි. | වසර 05 ට වැඩි ණය ශේෂයෙන් 2020 පෙබරවාරි මාසය වනවිට ගෙවා අවසන් ශේෂය රු.173,407 ක්, වාරික අයවෙමින් පවතින ශේෂය රු.101,857, අය නොවී පවතින ශේෂය රු.326,060 ක් සහ විශ්‍රාම ගිය අයගෙන් අයවිය යුතු ශේෂය UPF අරමුදලින් නිදහස් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තිකාරම් එය දෙන ලද කාර්යය නිමකළ විගස පියවීමට කටයුතු කළ යුතු වුවත් අවස්ථා 14 කදී ලබා දී තිබුණු රු.1,238,950 ක අත්තිකාරම් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පියවා නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ කාර්යය නිමවූ විගස අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා විධිමත් පාලන ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල් රෙගුලාසි 396 | 2016 නොවැම්බර් 03 දින සිට 2019 ජූනි 28 දින දක්වා කාලපරිච්ඡේදය තුළ අවලංගු කරන ලද රු.1,636,179 ක් වටිනා චෙක්පත් 287 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 571 | විවිධ කාර්යයන් සඳහා විශ්වවිද්‍යාලයේ තැන්පත්කළ වර්ෂ දෙකක් ඉක්මවූ රු.64,179,618 ක විවිධ තැන්පතු හා වසර පහකට වඩා වැඩි කාලයක් ගතවූ රු.11,312,500 ක පුස්තකාල තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 690.4 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 613.9ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 76.5ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුද්ගලික පඩිනඩි රුග මිලියන 797 කින් වැඩිවීමට සාපේක්ෂව රජයේ පුනරාවර්තන ප්‍රදාන රු. මිලියන 745 කින් සහ අභ්‍යන්තර ආදායම් රු. මිලියන 168 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම් වල ආරක්ෂාව හා පාලනය ශක්තිමත් වන පරිදි 2007 වර්ෂයෙන් පසු ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීමට අදාළ අංශ දැනුවත් කර ඇත. | ලේඛන විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරුන්ගේ පැමිණීම හා පිටවීම නිවැරදිව තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු. 24,849,209 ක් ගෙවා තිබුණි. | වර්තමානය වනවිට පැමිණීම හා පිටවීම තහවුරු කිරීමට ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ. | පැමිණීම හා පිටවීම සටහන් කිරීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ආ) පශ්චාත් හා ආචාර්ය උපාධි සඳහා 2011 වර්ෂයේ සිට විදේශගතවූ ආචාර්යවරුන් 22 දෙනෙකු නැවත සේවයට වාර්තා නොකිරීම නිසා බැඳුම්කර ගිවිසුම් කඩකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.97,259,926 ක් අයවිය යුතුව පැවතුණි. එසේම පළපුරුදු හා සුදුසුකම් ඇති ආචාර්යවරුන් විදේශගත වී නැවත නොපැමිණීම නිසා එම දැනුම විශ්වවිද්‍යාලයට ලබා ගැනීමේ අවස්ථාව ද අහිමි වී තිබුණි. | පාලක සභාවේ අනුමැතිය මත අධ්‍යයන කාර්ය මණ්ඩලයට තම පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමට අධ්‍යයන නිවාඩු නිර්දේශ කරනු ලැබේ. | බැඳුම්කර ගිවිසුම් කඩකිරීමෙන් අයවිය යුතු මුදල අයකර ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු විය යුතු අතර විදේශගතවූ ආචාර්යවරුන් නැවත ගෙන්වා ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඇ) පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා සම්පූර්ණ වැටුප් හා දීමනා සහිතව අධ්‍යයන නිවාඩු හා ප්‍රාග්ධන ප්‍රදාන ලබා දී විදේශගත වූ ආචාර්යවරුන් 5 දෙනෙකු එම සුදුසුකම් සපුරා ගැනීමෙන් තොරව සේවයට පැමිණීම හේතුවෙන් ආචාර්යවරයාගේ දැනුම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ මූලික අරමුණු ඉටු වී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | ආචාර්යවරු දෙදෙනෙකු පශ්චාත් උපාධි සුදුකම් සපුරාලීමට නැවත කැලණිය විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී ඇත. අනෙක් ආචාර්යවරු තිදෙනො ආචාර්ය උපාධිය හදාරමින් සිටින බව දක්වා ඇත. | ආචාර්යවරු විසින් පශ්චාත් උපාධිය අදාළ කාලය තුළ නිම කර සුදුසුකම් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)2019 දෙසැම්බර් 31 දිනට අරමුදල් ගිණුම් 04 ක තිබුණු එකතුව රු. 1,628,462 ක් වසර 02 කට වඩා වැඩි කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. එසේම පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ විදේශ සිසුන් වෙනුවෙන් නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා 2011 හා 2013 වර්ෂ වල ලැබී තිබුණු එකතුව රු. 6,450,758 ක ප්‍රදාන මුදල් අදාළ අරමුණු සඳහා යොදවා ගැනීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. තවද One Asia Foundation වැඩසටහන වෙනුවෙන් ලද ප්‍රදානයෙන් ඉතිරි රු.205,589 ක් වසර දෙකකට වඩා වැඩි කාලයක සිට ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලද රු.4,149,700 ක් හා ජාත්‍යන්තර සමුළු හා වැඩමුළු සඳහා ලබාගත් මුදලින් ඉතිරි වී තිබුණු රු. 6,907,764 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඌන උපයෝජිතව පැවතුණි. | නේවාසිකාගාරය සඳහා ලැබී තිබුණු රු.6,450,758 ක් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලැබී නොමැත. ඉතිරි අරමුදල් සම්බන්ධයෙන් ඉදිරියේදී සුදුසු පියවරයන් ගැනීමට කටයුතු කරනු ලැබේ. | අරමුදල් පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් මුදල් උපයෝජනය කිරීමට සැලසුම් කළ යුතුය. |
| (ආ)2019 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශිෂ්‍යත්ව අරමුදල් 10 ක හා තෑගි අරමුදල් 11 ක මුළු එකතුව රු. 5,720,965 ක් වූ ආයෝජන වලින් 2019 දෙසැම්බර් 31 දින දක්වා ලැබී තිබුණු රු. 7,730,800 ක පොලී ආදායම අදාල අරමුණු සඳහා යොදා ගැනීමෙන් තොරව ඌන උපයෝජිතව පැවතුණි. | අක්‍රීයව පවතින ශිෂ්‍යත්ව හා තෑගි අරමුදල් සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අරමුදල් පිහිටුවීමේ අරමුණ වෙනුවෙන් මුදල් උපයෝජනය කිරීමට සැලසුම් කළ යුතුය. |
| (ඇ)විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා වූ ආචාරධර්ම පද්ධතියට අනුව ශිෂ්‍යයින් සංවර්ධනය කිරීම හා ඉගැන්වීම මූලික අරමුණ බැවින් සියලුම ආචාර්යවරුන් නිරන්තරයෙන් පර්යේෂණ කටයුතු සිදුකල යුතු වුවද එම පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ එකතුව රු. 8,096,327 ක්වූ අරමුදල් 29 ක මුදල් වසරකට වඩා වැඩි කාලයක් උපයෝජනය කර නොතිබුණි. | ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින පර්යේෂණ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පර්යේෂණ සඳහා ලැබුණු අරමුදල් උපයෝජනය කර විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය ඉහළ නැංවීමට ක්‍රියාකළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නාට්‍ය හා ප්‍රතිබිම්බ කලා ඒකකයේ චිත්‍රාගාරය සඳහා 2017 ජනවාරි 27 දින මිලදීගත් රු. 9,929,568 ක් වටිනා කැමරා, රූපවාහිනී හා පරිගණක යන්ත්‍ර ද, 2016 වර්ෂයේදී ලැබී තිබූ පිරිවැය රු. 4,124,830 ක්වූ කැමරා 5 ක් හා පරිගණක යන්ත්‍ර 7 ක් එම වර්ෂවල සිට විගණිත දිනය වූ 2020 ජූනි 26 දින දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | චිත්‍රාගාරයේ ඉදිකිරීමේ කටයුතු අවසන් කළ පසු මෙම උපකරණ භාවිතා කිරීමට නියමිතය. | ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසු සැලසුම් සහගතව මිලදී ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ පීඨ 06 හි අනුමත හා තත්‍ය අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිවෙලින් 728 හා 636 ක් විය. ඒ අනුව පුරප්පාඩු 142ක් පැවතිය දී ආචාර්යවරු 148 දෙනෙකු සප්ත වාර්ෂික හා අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබීමෙන් ශිෂ්‍යයින් 12,028 දෙනෙකු වෙත අධ්‍යාපනය ලබා දීම සඳහා කථිකාචාර්යවරු 494 දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. ඒ අනුව ශිෂ්‍යයින්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සේවයේ නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | සිසුන්ගේ අධ්‍යයන කටයුතු වලට බාධාවක් නොවන පරිදි සප්ත වාර්ෂික හා අධ්‍යයන නිවාඩු ලබා දෙනු ලැබේ. | කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |